සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education - Western Province மேல் மாகாணக் கல்வித் திணைக்களம்

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ශිල්ප කලා | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතු යි:**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- 1 පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

(01) අතීතයේ සිටම මිනිසා තම හැඟීම්, සෞන්දර්යාත්මක වූ නිර්මාණ ලෙස ඉදිරිපත් කිරීමට පෙළඹී ඇත. උගත්, බුද්ධිමත් අය අතින් පෝෂණය වූ නිර්මාණය වන්නේ,

(1) ලී කැටයම් ය. (2) කාව්‍ය නිර්මාණ ය.
(3) ලාක්ෂා නිර්මාණ ය. (4) කෝලම් රංගන ය.

(02) වෙහෙර විහාර බිතුසිතුවම්වලට ආරක්ෂිත ආවරණයක් ලෙස භාවිතවන ආලේපනයක් වූ ප්‍රංශ පොලිෂ් සෑදීම සඳහා ගනු ලබන්නේ,

(1) මැටි ය. (2) ලාටු ය. (3) ලාක්ෂා ය. (4) තලකිරියා ය.

(03) ජාත්‍යන්තරව සම්මත මිනුම්වලට අනුකූල වූ, $A_0$ සිට $A_6$ දක්වා කඩදාසි වෙළෙඳ සැලෙන් මිලදී ගත හැකි වේ. $A_4$ කඩදාසියකින් වෙන්කර ගත හැකි පොස්ට් කාඩ් ප්‍රමාණයේ කඩදාසි ප්‍රමාණය වන්නේ,

(1) 8 කි. (2) 4 කි. (3) 12 කි. (4) 6 කි.

(04) පැන්සල් සඳහා යොදා ගන්නා මිනිරන්වල මෘදු ගතිය හා තද ගතිය අනුව, පැන්සල් වර්ග කෙරේ. ජ්‍යාමිතික නිර්මාණ සඳහා වඩාත් සුදුසු පැන්සල් කාණ්ඩය වන්නේ,

(1) H, HB, 2H යන ත්‍රිකෝණ හැඩයෙන් යුත් පැන්සල් ය.
(2) B, 2B, 3B යන ෂඩාශ්‍ර හැඩයෙන් යුත් පැන්සල් ය.
(3) H, 4H, 3B යන සමචතුරස්‍ර හැඩයෙන් යුත් පැන්සල් ය.
(4) 2H, HB, 2B යන රවුම් හැඩයෙන් යුත් පැන්සල් ය.

(05) කාර්මික ඇඳීමේ දී පමණක් භාවිත වන, සම්මත වූ රේඛා පිළිබඳව දැන සිටීම, ඉතා වැදගත් ය. ජ්‍යාමිතික නිර්මාණවල දී වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා යොදා ගනු ලබන්නේ,

(1) කඩ රේඛා ය. (2) සිහින් දාම රේඛා ය.
(3) ඝන අඛණ්ඩ රේඛා ය. (4) සිහින් අඛණ්ඩ රේඛා ය.

(06) නිවැරදි වෘත්ත නිර්මාණය සඳහා කවකටුව අත්‍යාවශ්‍යම උපකරණයකි. වෘත්තයක මහා කේන්ද්‍රික ඛණ්ඩය හා කුඩා කේන්ද්‍රික ඛණ්ඩය දක්වන රූපය වන්නේ,



A B C D

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(07) පහත දැක්වෙන්නේ පැච්වර්ක් නිර්මාණයකට සුදුසු රූප සටහනකි. එම රූපය අධ්‍යයනයේ දී හඳුනා ගත හැකි ජ්‍යාමිතික හැඩතල වන්නේ,



(1) සෘජු කෝණාස්‍ර, ත්‍රිපීසියම හා ත්‍රිකෝණ යි.
(2) රොම්බස, ත්‍රිපීසියම හා සෘජු කෝණී ත්‍රිකෝණ යි.
(3) රොම්බාභ, සමාන්තරාස්‍ර හා සුළු කෝණී ත්‍රිකෝණ යි.
(4) සමචතුරස්‍ර, ආයත චතුරස්‍ර හා මහා කෝණී ත්‍රිකෝණ යි.

(08) පහත රූපයෙන් දැක්වෙන්නේ ෂඩාශ්‍රාකාර වූ ආභරණ සුරකුම් පෙට්ටියකි. එහි ඇතුළත එක හා සමාන වූ කොටස් තුනකට බෙදා ඇත. එසේ බෙදූ එම කොටස්වල ජ්‍යාමිතික හැඩය වන්නේ,



(1) සෘජු කෝණාශ්‍රාකාර හැඩය යි.
(2) රොම්බසාකාර හැඩය යි.
(3) සමචතුරස්‍රාකාර හැඩය යි.
(4) ත්‍රිපීසියමක හැඩය යි.

(09) පහත දක්වා ඇත්තේ පහසුවට අතේ ගෙන යා හැකි සැහැල්ලු බෑගයක විකසනයකි. එම විකසනයට අදාළ පරිදි අලවා ගැනීමෙන් ලැබෙන බෑගයේ නිවැරදි හැඩය වන්නේ,



(A)



(B)



(C)



(D)



(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

(10) බොහෝ ජ්‍යාමිතික නිර්මාණ සඳහා විවිධ හැඩතල යොදාගැනීම සිදුවේ. ජ්‍යාමිතික නිර්මාණයක දී, නාභිය, මහා අක්ෂය හා සුළු අක්ෂය දැකිය හැකි වන්නේ,

(1) බහු අස්‍රයක් නිර්මාණයේ දී ය. (2) සිලින්ඩරයක් නිර්මාණයේ දී ය.
(3) වෘත්තයක් නිර්මාණයේ දී ය. (4) ඉලිප්සයක් නිර්මාණයේ දී ය.

(11) අතීතයේ වර්ණ ලබාගැනීමට භාවිත කළ පාරිසරික සම්පත් බොහෝ ඇත. අදටත් කහ දුඹුරු වර්ණය ලබා ගැනීමට භාවිත කරන ද්‍රව්‍යය වන්නේ,

(1) කොස් අරටුව ය. (2) නිල් අවරිය ය. (3) සාදිලිංගම් ය. (4) අඳුන් දැලි ය.

(12) බොහෝ අවස්ථාවල නූල් හා රෙදිවලට අපද්‍රව්‍ය එකතු වේ. නූල්වලින් අපද්‍රව්‍ය ඉවත් කරන අනුපිළිවෙල වන්නේ,

(1) කාබනීකරණය, මැලියම්හරණය හා විරංජනය යි.
(2) කැඳහරණය, මලහරණය හා විරංජනය යි.
(3) මැලියම්හරණය, කැඳහරණය හා මලහරණය යි.
(4) විරංජනය, කාබනීකරණය හා මලහරණය යි.

(13) අතීතයේ වනිතාවන් තම රුව ආලෝකමත් කර ගැනීමට, විවිධ ආලේප භාවිත කර ඇත. කහ, කස්තුරි හා ඇලම් කුඩුකර, තලතෙල් සමඟ මිශ්‍ර කිරීමෙන් හින්දු කතුන් සාදා ගනු ලබන්නේ,

(1) කුංකුම ය. (2) මරතොණ්ඩි ය. (3) පඬුදියර ය. (4) අඳුන් දැලි ය.

(14) රෙදි හා නූල්වලට වර්ණ ගැන්වීම, අතීතයේ සිටම පැවැත එන ක්‍රියාවලියකි. වර්තමානයේ දී, බතික් රෙදි වර්ණ ගැන්වීමේ දී එම වර්ණය කොටස් දෙකකින් යෙදිය යුතු සායම් වර්ගය වන්නේ,

(1) බ්‍රෙන්තෝල් සායම් ය. (2) වැට් සායම් ය.
(3) ප්‍රෝෂියන් සායම් ය. (4) නෙප්තෝල් සායම් ය.

(15) සෑම නිර්මාණ කලාවකටම එය ජනිත වූ ස්ථානයක් ඇත. බතික් කලාව ජනිත වූ ස්ථානය ලෙස සැලකෙන්නේ,

(1) අප්‍රිකාව ය. (2) රුසියාව ය.
(3) මාලදිවයින ය. (4) ඉන්දුනීසියාව ය.

(16) වර්ණ ගැන්වීමට ප්‍රථම රෙදි පෙරපිරියම්කරණයට භාජනය කළ යුතු ය. බතික් රෙදිවලට වර්ණ ගැන්වීමට පෙර කළ යුතු වන්නේ,

(1) පිරිසිදු ජලයෙන් සෝදා වේලා ගැනීම ය.
(2) සෙ.මී 1 පළලට නූල් ඔතා ගැට යොදා ගැනීම ය.
(3) අදාළ කොටස්වල උණු කළ ඉටි ගල්වා ගැනීම ය.
(4) ලුණු දැමූ ජලයට දමා පොඟවා ගැනීම ය.

(17) දේශගුණික සාධක අනුව කෙඳිවල ගුණාංග බොහෝ සේ වෙනස් වේ. දැනට තිබෙන ඉතා උසස් කපු විශේෂය වන්නේ,

(1) ඇමෙරිකන් කපු ය. (2) මිසර කපු ය. (3) සී අයිලන්ඩ් කපු ය. (4) පිලර් කපුය.

(18) රෙදි විවීම සඳහා කෙඳි ලබාගන්නා විධි ප්‍රධාන වශයෙන් හතරකි. කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන් හා නයිට්‍රජන් යන මූලද්‍රව්‍ය සංයෝග වීමෙන් සකස් වී ඇති කෙඳි වර්ගය වන්නේ,

(1) ප්‍රොටීන් කෙඳි ය. (2) සෙලියුලෝස් කෙඳි ය.
(3) සංස්ලේශිත කෙඳි ය. (4) කෘත්‍රිම කෙඳි ය.

(19) නූලේ අංකනය අනුව එම නූලේ දිග, බර හා නූල් පොටවල් ගණන තීරණය කළ හැකි ය. නූල් කිලෝ ග්‍රෑමයකින් සෑදූ මීටර් 1000 දිග නූල් කැරලි ගණන, එම නූලේ අංකනය ලෙස ප්‍රකාශ වන්නේ,

(1) ඩෙනියර් ක්‍රමයේ දී ය. (2)ඉංග්‍රීසි ක්‍රමයේ දී ය.

(3) ඩෙසිටෙකිස් ක්‍රමයේ දී ය. (4) මෙට්‍රික් ක්‍රමයේ දී ය.

(20) කමීස නූල් හැදයක දිග මීටර් 80කි. පළල සෙ.මී 100කි. එහි දික් සෙ.මී 1ක් සඳහා අංකනය 2/20ක් වූ නූල්පොටවල් 36ක් යොදා ඇත. එම නූල් හැදයට අවශ්‍ය දික්නූල් පොටවල් ගණන වන්නේ,

(1) 100 X 50 = 5000 කි. (2) 50 X 36 = 1800 කි.

(3) 100 X 36 = 3600 කි. (4) 100 X 50 X 2/20 = 500 කි.

(21) යන්ත්‍ර රාමුවකට සවිකළ අංග රාශියකින් පේෂයන්ත්‍රය නිර්මාණය වී ඇත. පේෂ යන්ත්‍රයක කොටස් අතරින් රූපයේ දැක්වෙන්නේ,



(1) දික්නූල් කූර යි. (2) අළුව යි.

(3) පූඩු වැල් පේලිය යි. (4) පනාව යි.

(22) 21 ප්‍රශ්නයේ දක්වා ඇති යන්ත්‍ර කොටසින් සිදුවන්නේ,

(1) හරස්නූල් තදකර ගැනීම ය. (2) මෝස්තර රටාව ලබාගැනීම ය.

(3) දික් නූල් ඇඳ ගැනීම ය. (4) යන්ත්‍රය ස්ථාවරව තබා ගැනීම ය.

(23) ඉතා තුනී සියුම් රෙදි ලෙස සාරි, සරොම්, වේට්ටි, චීත්ත, ඕගන්දි වොයිල් රෙදි දැක්විය හැකි ය. එම රෙදි වියීම සඳහා යොදාගන්නා වියමන් රටාව වන්නේ,

(1) සැටින් වියමන ය. (2) සරල හීරී වියමන ය.

(3) ජටා වියමන ය. (4) චාම් වියමන ය.

(24) රෙදි වියීම සඳහා නූල් හැදයක් සැකසීමේ දී පළමුවෙන්ම දික්නූල් කූරුවලට නූල් ඔතා ගත යුතු ය. ඒ සඳහා භාවිත කරන උපකරණ කට්ටලය වන්නේ,

(1) නූල්බෙරය, නූල් බෙත්ම හා දික්නූල් කූරු රාක්කය යි.

(2) මල් චක්‍රය, මල්චක්‍රකරුව හා එතුම රෝදය යි.

(3) ලීවර රාමුව, පූඩුවැල් පේලී හා අළුව යි.

(4) හරස් පොලු, පාපොලු හා පසු කඳ යි.

(25) මිලදී ගත් තනිපට නූල් මිටියක නූල් කැරලි 80කි. එහි බර කිලෝ ග්‍රෑම් 2කි. එම නූලට දිය හැකි අංකනය වන්නේ,

(1) 40 කි. (2) 80 කි. (3) 60 කි. (4) 20 කි.

(26) නූලේ අංකනය 20ක් වූ නූල් මිටියක බර කිලෝග්‍රෑම් 5කි. එහි ඇති නූල් කැරලි ගණන වන්නේ,

(1) 20 කි. (2) 40 කි. (3) 100 කි. (4) 50 කි.

(27) ළමා නිර්මාණ අතර, වියමන් රටා රාශියක් දක්නට ලැබිණ. පහත දැක්වෙන රටා අතරින් දික්නූල් දෙකකින් හා හරස් නූල් දෙකකින් වියා ගතහැකි වියමන වන්නේ,




(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(28) කෙඳි වර්ග පරීක්ෂා කිරීම සඳහා යොදා ගන්නා සරල පරීක්ෂණ විධි කිහිපයකි. එයින් ඉතා පහසුම ක්‍රමය වන්නේ,

(1) අන්වීක්ෂ පරීක්ෂාව ය. (2) පිළිස්සුම් පරීක්ෂාව ය.

(3) ස්පර්ශකර බැලීම ය. (4) පැල්ලම් පරීක්ෂාව ය.

(29) පේෂකාර්මික උපකරණ, වැඩි වශයෙන් ලී වලින් සාදා ඇත. පහත දැක්වෙන උපකරණ අතරින් හරස් නූල් ඔතා ගැනීම සඳහා භාවිත කරන්නේ,




(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

(30) අතීතයේ සිටම රෙදි වියීමේ කාර්යය විවිධ ක්‍රම අනුව සිදුවී ඇති බවට බොහෝ සාධක ඇත. විසිතුරු පටියක් වියා ගැනීම සඳහා යොදා ගත් ක්‍රමය වන්නේ,

(1) හැඩ පෙති ආධාරයෙන් වියීම ය. (2) අත් යන්ත්‍රයෙන් වියීම ය.

(3) මේස යන්ත්‍රයෙන් වියීම ය. (4) යුටිලිටි යන්ත්‍රයෙන් වියීම ය.

(31) මැසීමෙන් රෙදිපිළි අලංකරණයේ දී, රූපයේ දැක්වෙන පරිදි මල් පෙති හා කොළ පිරවීම සඳහා යොදා ගනු ලබන්නේ,



(1) නැටි මැස්ම ය. (2) බූලියන් මැස්ම ය.

(3) සැටින් මැස්ම ය. (4) කතිර මැස්ම ය.

(32) පහත දක්වා ඇත්තේ පැච්වර්ක් නිර්මාණයකට සුදුසු චිත්‍රයකි. මෙම චිත්‍රය සකසා ගැනීමට අවශ්‍ය රෙදි කොටස් ගණන වන්නේ,



(1) 10 කි. (2) 13 කි.

(3) 12 කි. (4) 6 කි.

(33) මාතෘ පාෂාණය භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක හේතු මත ජීර්ණය වීමෙන් මැටි සෑදේ. මැටි ජීර්ණයට බලපාන රසායනික හේතුවක් වන්නේ,

(1) හිම පතනය ය. (2) සූර්යතාපය ය. (3) අම්ල වැසි ය. (4) තද සුළං ය.

(34) විවිධ ප්‍රදේශවලින් ලබා ගන්නා මැටි විවිධ ගුණ අඩු වැඩි වශයෙන් දක්වයි. මැටිවල නම්‍යතාවය ඇති කරන්නා වූ සුවිශේෂ ගුණය හඳුන්වන්නේ,

(1) සුවිකාර්යතා ගුණය ලෙස ය. (2) සච්ඡිරතා ගුණය ලෙස ය.

(3) හැකිලීමේ ගුණය ලෙස ය. (4) ජලය උරා ගැනීමේ ගුණය ලෙස ය.

(35) මහා පරිමාණ ලෙස මැටි පදම් කිරීමේ කාර්යයේ දී අඹරාගත් මැටි මිශ්‍රණයේ වූ වැඩිපුර ජලය මිරිකා හැර කැන්වස් රෙදි අතර මැටි රඳවා තබා ගන්නේ,

(1) බෝල්මිල් යන්ත්‍රය මගින් ය. (2) ෆිල්ටර් ප්‍රෙස් යන්ත්‍රය මගින් ය.

(3) ජෝක්‍රෂරය මගින් ය. (4) රෝලර් ක්‍රෂරය මගින් ය.

(36) මුලින්ම මැටි භාණ්ඩ නිපදවා ඇත්තේ තහඩු ක්‍රමයටය. පහත දැක්වෙන භාණ්ඩ අතරින් තහඩු ක්‍රමයට නිපදවා ඇති භාණ්ඩ වන්නේ,

A  B  C  D 

(1) A හා B ය.

(2) B හා C ය.

(3) A හා D ය.

(4) B හා D ය.

(37) ඇලෙන සුළු අමුද්‍රව්‍ය වැඩි වූ මැටිවලින් භාණ්ඩ නිපදවිය නොහැකි නිසා ඒවා සුදුසු තත්ත්වයට පත්කර ගැනීමට නොඇලෙන සුළු අමුද්‍රව්‍ය හා මිශ්‍රකර ගනු ලැබේ. මෙහිදී පිළිස්සීමේ දී පළුදු වූ භාණ්ඩ අඹරා ලබාගත් කුඩු හඳුන්වන්නේ,

(1) කෙඔලින් නිමිනි. (2) පෙල්ඩ්ස්පාර් නමිනි. (3) ඩොලමයිට් නමිනි. (4) ග්‍රොග් නමිනි.

(38) පදම් මැටි හෝ දියර භාවිතයෙන් නිර්මිත භාණ්ඩ, භාවිතයට සුදුසු තත්ත්වය පත්කර ගැනීම සඳහා පිළිස්සීම කළ යුතු වේ. ඒ සඳහා මහා පරිමාණ වශයෙන් යොදාගන්නා පෝරණුව වන්නේ,

(1) ග්‍රාමීය පෝරණුව යි. (2) දේශීය පෝරණුව යි.

(3) ආවරක පෝරණුව යි. (4) දෝණ පෝරණුව යි.

(39) දිස්න යෙදූ පසු භාණ්ඩවලට විසිතුරු වර්ණවත් බවක් හා කල් පැවැත්මක් ඇති වේ. එම පිළිස්සීම හඳුන්වන්නේ,

(1) පළමු පිළිස්සීම ලෙස යි. (2) දෙවන පිළිස්සීම ලෙස යි.

(3) තෙවන පිළිස්සීම ලෙස යි. (4) බිස්කට් පිළිස්සීම ලෙස යි.

(40) වර්ණවත් හා විසිතුරු කඩදාසි උපයෝගී කරගනිමින් මැටි භාණ්ඩ අලංකාර කිරීම ඉතා ජනප්‍රිය ක්‍රමයකි. ඉන් එක් ප්‍රභේදයක් වන ඩෙකොපාජ් ක්‍රමයේ දී සිදුවන්නේ,

(1) කඩදාසි ඉරා ඇලවීමෙන් නිර්මාණ සැකසීම යි.

(2) කඩදාසි කොටස් කපා ඇලවීමෙන් නිර්මාණ සැකසීම යි.

(3) කඩදාසි පල්ප භාවිත කර නිර්මාණ සැකසීම යි.

(4) ජලයේ පොගවා ගත් කඩදාසි ඇලවීමෙන් නිර්මාණ සැකසීම යි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ශිල්ප කලා | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) වර්ෂ 2020 මාර්තු මස සිට අප රට මුහුණ දුන් කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා පාසල් පවා වසා දැමීමට සිදුවිය. නමුත් සිසුන්ගේ වටිනා කාලය අපතේ නොයවා විවිධ නව නිර්මාණවලට සිසුන්ගේ අවධානය යොමු කිරීමට රජයේ විවිධ මාධ්‍ය තුළින් වැඩසටහන් හා උපදෙස් ද ප්‍රචාරය විය. තාක්ෂණ විෂයයන් හදාරන සිසුන් සඳහා ''නංවමු ශ්‍රී ලංකා'' නම් වැඩසටහන යටතේ නිර්මාණ තරඟාවලියක් හා ප්‍රදර්ශනයක් ද සැලසුම් කර ඇත.

(i) මෙම ප්‍රදර්ශණය සඳහා ප්‍රදර්ශන භාණ්ඩ තැනිය හැකි ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.

(ii) ප්‍රදර්ශනයට තැබිය හැකි මැටි භාණ්ඩ වර්ග හතරක් දක්වන්න.

(iii) ගෙතීම උපයෝගී කරගනිමින් කළ හැකි නිර්මාණ හතරක් සඳහන් කරන්න.

(iv) පුටු කවරයකට සුදුසු පැච්වර්ක් නිර්මාණයක් ඇඳ දක්වන්න.

(v) මෙම රෝගය වැළැක්වීමට උරදුන් සියලු ම දෙනා උදෙසා පිරිනැමීමට සුදුසු සමරු තිළිණයක ආකෘතියක් ඇඳ, එයට ආදර්ශමත් වැකියක් ද ඇතුළත් කරන්න.

(vi) ප්‍රදර්ශනයේ ආරාධිත අමුත්තන්ට ප්‍රදානය කිරීමට නිලලාංඡනයක් නිර්මාණය කරන්න.

(vii) ප්‍රදර්ශනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට පෝස්ටරයක් ඇඳ දක්වන්න.

(viii) ඉදිරිපස තොරණ සඳහා ගොක්කොල යොදා ගනිමින් සැරසීමට සුදුසු වියමන් රටාවක් ඇඳ පෙන්වන්න.

(ix) මැටි බඳුනකට සුදුසු මෝස්තරයක් ඇඳ, වර්ණ ගන්වන්න.

(x) නිමකළ ප්‍රදර්ශන භාණ්ඩයක් රු. 500 කට විකිණීමට මිල නියම කර ඇති අතර, ඉන් 10% ක ලාභයක් ලබා ගන්නේ නම් භාණ්ඩයට වැය වූ මුදල කොපමණද?

(ලකුණු $2 \times 10 = 20$)

(02) බොහෝ නිර්මාණවල ජ්‍යාමිතික හැඩතලයක් හෝ හැඩතල කිහිපයක් දැකිය හැකි ය.

(i) පාදයක දිග සෙ.මී. 5 ක් වූ ABC සමපාද ත්‍රිකෝණය ඇඳ, එහි BC පාදය D දක්වා දික් කරන්න. ACD කෝණයේ අගය දක්වන්න. (ලකුණු 02)

(ii) අරය සෙ.මී 3 ක් වූ වෘත්තය ඇඳ, ඒ තුළ සවිධි ෂඩාශ්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(iii) අංශක 65ක් වූ A B C කෝණය නිර්මාණය කර, පාදයක් සෙ.මී. 5 ක් වූ රොම්බසය අඳින්න. (ලකුණු 04)

(03) රෙදිපිළි අලංකාර කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේද සායම් වර්ග හා උපාංග ආදිය දිනෙන් දින වෙනස් වෙමින් පවතී.

(i) ඔබ දන්නා අලංකරණ විධි හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ළමා අඳුමකට සුදුසු මෝස්තරයක් ඇඳ, එය වර්ණ ගන්වන ආකාරය දක්වා, එය සිදුකරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(iii) සාරි පල්ලුවකට සුදුසු මෝස්තරයක් ඇඳ, එය වර්ණ ගන්වන ආකාරය යොදා ගන්නා උපාංග සහිතව විස්තර කරන්න. (ලකුණු 04)

(04) නවීන රෙදි විවීමේ යන්ත්‍ර බිහිවී ඇතත්, අද ද ඉන්දියාවේ අත්යන්ත්‍ර රෙදිවිවීම ප්‍රචලිතව පවතී.

(i) අත්පිස්නාවක් විවීමට යොදාගන්නා වියමන් රටාවක් නම් කර, ඇඳ පෙන්වන්න. (ලකුණු 02)

(ii) රෙද්දක එක් වාටියක සිට අනිත් වාටිය දක්වා ඇද නොවී (ආනතව) ඇලව හිරී රේඛාවක් ගමන් ගන්නා වියමන නම් කර, එහි ඒකකයක් ඇඳ පෙන්වන්න. (ලකුණු 04)

(iii) කමීස රෙදි හැදයක දිග මීටර් 200කි. පළල සෙ.මී. 60කි. එම හැදයේ දික් සෙන්ටිමීටරයක් සඳහා නූල් අංකනය $\frac{2^3}{40}$ ක් වූ නූල් ප්‍රමාණය සොයන්න. (ලකුණු 04)

(05) විවිධ ප්‍රදර්ශනවල දී රෙදිපිළිවලට අමතරව විවිධාකාර ලෙස නිර්මාණය කළ, ප්‍රදර්ශන භාණ්ඩ දැකිය හැකි ය.

(i) අත් යන්ත්‍රයක ප්‍රධාන කොටස් හතර නම් කරන්න. (ලකුණු 02)

(ii) වර්ණවත් කඩදාසි හෝ කඩදාසි පල්ප භාවිතයෙන් පබලු සාදා මාලයක් නිර්මාණය කරන ආකාරය රූප සටහන් මඟින් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) බිත්ති අලංකරණයකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ ගන්වා, එය අලංකාර කළ හැකි ක්‍රමවේද දෙකක් ලියන්න. (ලකුණු 04)

(06) එදිනෙදා භාවිතයට ගැනෙන මැටි භාණ්ඩ වර්තමානයේ ද ඉතා ජනප්‍රියය.

(1) මැටි භාණ්ඩ නිර්මාණය කරන ක්‍රමවේද හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) භාණ්ඩ ප්‍රතිනිර්මාණය කිරීමට යොදාගන්නා මෙවලම නම් කර, එමඟින් සාදාගත හැකි භාණ්ඩ වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මැටි භාණ්ඩ බිස්කට් තත්වයට පිළිස්සූ පසුව යෙදිය හැකි අලංකරණ ක්‍රමයක් නම් කර, එය සිදු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(07) උද්‍යාන අලංකරණය පිළිබඳව ශිල්පීය මෙන්ම ප්‍රායෝගික දැනුම ලබා තිබීම වර්තමානයේ ඉතා වටිනා ආදායම් මාර්ගයකි.

(i) උද්‍යාන උපාංග සෑදීමට සුදුසු අමුද්‍රව්‍ය දෙක ලියන්න. (ලකුණු 02)

(ii) උද්‍යාන විද්‍යා මූලධර්ම හතරක් නම් කර, ඒවායින් අදහස් වන දෑ විස්තර කරන්න. (ලකුණු 04)

(iii) උද්‍යානයේ පොකුණක් අසල තැබීමට සුදුසු සත්ත්වයෙක් නම් කර, එය නිර්මාණය කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ශිල්ප කලා | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 1 | (21) | 4 | (31) | 3 |
| (2) | 3 | (12) | 2 | (22) | 1 | (32) | 4 |
| (3) | 2 | (13) | 1 | (23) | 4 | (33) | 3 |
| (4) | 4 | (14) | 3 | (24) | 2 | (34) | 1 |
| (5) | 3 | (15) | 4 | (25) | 1 | (35) | 2 |
| (6) | 1 | (16) | 1 | (26) | 3 | (36) | 4 |
| (7) | 4 | (17) | 3 | (27) | 1 | (37) | 4 |
| (8) | 2 | (18) | 1 | (28) | 3 | (38) | 4 |
| (9) | 1 | (19) | 4 | (29) | 3 | (39) | 2 |
| (10) | 4 | (20) | 3 | (30) | 1 | (40) | 2 |

(ලකුණු 1 × 40 = 40)

### II පත්‍රය

(01) (i) පන් කර්මාන්තය, කොහු කර්මාන්තය, කැටයම් කලාව, විසිතුරු භාණ්ඩ, රැක් කලාව, විසිතුරු ආබරණ, උද්‍යාන උපාංග, මල් සැකසුම්, රෙදි කැබලි ආශ්‍රිත නිර්මාණ, මුද්‍රිත මැටි භාණ්ඩ, ගෘහ අලංකරණ ද්‍රව්‍ය.

(ii) පුන් කලස්, මල් බඳුන්, වතුර භාජන, ජෝගු, පැන් කෙණ්ඩි, මුට්ටි, කළ

(iii) බැනියම්, හැට්ට, තොප්පි, අත්මේස්, ළදරු ඇඳුම්, මේස රෙදි

(iv) සුදුසු නිර්මාණයකට ලකුණු දෙන්න.

(v)



සුදුසු වැකිවලට ලකුණු දෙන්න.

(vi) සුදුසු නිල ලාංඡනයකට ලකුණු දෙන්න.

(vii) සුදුසු පෝස්ටරයක් සඳහා ලකුණු දෙන්න.

(viii) වියමන් රටා



(ix) සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න.

(x) විකුණුම් මිල = රු. 500.00

ලබන ලාභය = 10%

වැය කල මුදල = $\frac{90}{100} \times 500 = 450$

= රු. 450.00

(ලකුණු 2 × 10 = 20)

(02) (i)




180 - 60 = 120

(ලකුණු 02)

(ii)




(ලකුණු 04)




(ලකුණු 04)

(මුළු ලකුණු 10)

(03) (i) පින්තාරු කිරීම, සායම් පෙවීම, බතික් කිරීම, ගැටපඩු ක්‍රමය, මුද්‍රණය කිරීම, මල් මැසීම, උපාංග ඇල්ලීම හා ඇලවීම.

↓

තහඩු මුද්‍රණය, ස්ටෙන්සිල් මුද්‍රණය, තිර රාමු මුද්‍රණය, හීට් ඇන්ඩ් බොන්ඩ් ක්‍රමය (ලකුණු 02)

(ii) ළමා ඇඳුමකට සුදුසු නිර්මාණයක් ඇඳීම. (ලකුණු 04)

(iii) සාරි පල්ලුවකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ ගැන්වීම හා උපාංග නම් කිරීම ඇලවීම විස්තර කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(04) (i) ජටා වියමන



(ලකුණු 02)

(ii) සරල හීරි වියමන



(ලකුණු 04)

දික්දාර හෝ හරස්දාර වියමන් වලට ලකුණු දෙන්න.

(iii) $\frac{\overset{1}{\cancel{200}} \times \overset{3}{\cancel{60}} \times \overset{6}{\cancel{30}} \times \overset{1}{\cancel{2}}}{\underset{5}{\cancel{1000}} \times \underset{2}{\cancel{40}}} = 18kg$ (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(05) (i) අළුව, පුඩුවැල්, ලීවර රාමුව, ලීවර, පනාව, හරස් පොලු, පා පොලු ලීස් පොලු, ඉදිරිකඳ ,පසුකඳ, යන්ත්‍ර රාමුව, වාඩිවෙන ආසනය (ලකුණු 02)

(ii) වර්ණවත් කඩදාසි, තීරු හා ත්‍රිකෝණාකාර හැඩයට පටි කැපීම, රෝල් කිරීම හා ඇලවීමෙන් පබලු සෑදීම. එසේ සෑදූ පබලු අමුණමින් මාලයක් සාදන ආකාරය විස්තර කිරීම

හෝ

කඩදාසි දින 2ක් ජලයේ පොගවා ජලය මිරිකා හැර හොඳින් කොටා පොඩිකර ගම් වර්ගයක් මිශ්‍ර කිරීම හා කෘමි ආරක්ෂක ද්‍රව්‍යයක් මිශ්‍ර කරගනිමින් පල්පය සාදා එයින් විවිධ හැඩයේ පබලු මැද සිදුරක් තබා සාදාගෙන වර්ණ ගන්වා වියලා ගැනීමෙන් පසු ඒවා අමුණා මාලයක් සාදා ගැනීම විස්තර කිරීම. (ලකුණු 04)

(iii) සුදුසු මෝස්තරයක් සඳහා (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(06) සුදුසු බිත්ති අලංකරණය ඇඳ වර්ණ ගැන්වීම හා එය අලංකාර කර ගැනීම සඳහා රිබන් වලින් හෝ නූල් කැරලි යොදා මැසීම පින්තාරු කිරීම, වැලි, ලී කුඩු වැනි ද්‍රව්‍ය ඇලවීම විස්තර කිරීම.

(i) ඇඹීම, තහඩු ක්‍රමය, දරණු ක්‍රමය, ඉදිකිරීම, අච්චු භාවිතය (ලකුණු 02)

(ii) මෙවලම - අච්චුව
කිරි හට්ටි, මල් බඳුන්, අළු බඳුන්, පිඟන් කෝප්ප, ජෝග්ගු, සුරතල් සතුන්, බුද්ධ රූප, දේව රූප, බිත්ති අලංකරණ (ලකුණු 04)

(iii) වර්ණ ආලේප කිරීම, මල් මෝස්තර පින්තාරු කිරීම, ඩෙකෝපාජ් ක්‍රමයට රූප හා දර්ශන කපා ඇලවීම, කොලාජ් ක්‍රමයට විවිධ හැඩයට ඉරා ඇලවීම, ලණු, සිප්පි කටු, වැලි, ගල් කැට රටාවකට ඇලවීම. එක් ක්‍රමයක් විස්තර කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(07) (i) ප්ලාස්ටර් පැරිස්, සිමෙන්ති, ලී, මැටි, කඩදාසි හා ලී පල්ප (ලකුණු 02)

(ii)
- අවකාශය - අව්ව, වැස්ස හා වතුර බැස යාම සලකා බලා නිර්මාණය අනුව සුදුසු තැනක් තෝරා ගැනීම.
- සම්පිණ්ඩනය - වෙනත් නිර්මාණ හා ගැලපීම සමඟ සමස්ථය ගොඩනැගීම.
- අනුපාතය - හැඩතල හා රූපවල පරිමාව නියමිත ප්‍රමාණ වලට යොදා ගැනීම.
- විවිධත්වය -
- සමබරතාවය - ප්‍රමාණය ඉක්මවා නොයාම හිස් පාලු ස්ථාන වැඩි නොවන සේ උපාංග යොදා තිබීම.
- කැපී පෙනෙන සුළු බව -
- නිමාව - (ලකුණු 04)

(iii)
- දිය බොන මුවෙක්, කොකෙක්, තාරාවෙක්, හාවෙක්, ගෙම්බෙක්
- පාදම සැකසීම, රූපයේ සැකිල්ල ඊට සම්බන්ධ කර ගොඩනැගීම, බදාමය හෝ පල්පය සෑදීම, ඒවා සැකිල්ල මත තැවරීම, නියමිත හැඩය ගැන්වීම, නිමාවක් දීම, වියලීම, වර්ණ ගැන්වීම. (ලකුණු 04)

(මුළු ලකුණු 10)